


සාලිය ගලප්පත්ති

ඔස්ට්‍රේලියාවේ දේශපාලන කරළියේ මෑතක සිටම ගැටුම් ය. නරඹන්නන් ගේ ත්‍රාසය කුතුහලය පමණක් නොව සංවේගය හා වෛරය මතු කරන ජවනිකා ද මෙහි දී දැක බලා ගත හැක. 1996 දී බලයට පත් වූ ජෝන් හවඩ් අගමැතිවරයාට අවශ්‍ය වූයේ මේ රට තවත් ඇමරිකාවක් කරන්නට ය. 1977 දී බලයට පත් ජේ ආර් ජයවර්ධන ජනාධිපති වරයාට අවශ්‍ය වූයේ ශ්‍රී ලංකාව තවත් සිංගප්පූරුවක් කිරීමට බව අපට මතකය. අවසානයේ ලෝකයේ ලොකුම අපායක් බවට ශ්‍රී ලංකාව පත් විය. ඔස්ට්‍රේලියාව තවමත් ජෝජ් බුෂ් ගේ ඇමරිකාව බවට පත් නොවුණත් යැංකි වියරුව අනුවම නටන්නට පටන්ගෙන ඇති බව නම් පෙනෙයි.

පසුගිය මාසයේ දිනෙක හවඩ් අගමැතිවරයා මහත් කලබලයකින් විද්‍යුත් මාධ්‍ය ඉදිරියට පැමිණියේ ය. මුහුණින් දිස් වූයේ ළඟම ඥාතියෙකු වියෝ වූ මොහොතක මුහුණක දිස් වන පෙනුමම ය. නොහඬා ප්‍රකාශ කළේ පසුගිය 2004 මැතිවරණයේදී සැමට සුව සෙත ව්‍යාපෘතිය සඳහා තමා විළන ලද ආරක්ෂක දැල භාණ්ඩාගාරික පීටර් කැස්ටෙලෝ ඇමතිවරයා විසින් කපා දමමින් සිටින බව ය. මෙයට සමගාමීව සෞඛ්‍ය ඇමති ටෝනි ඇබට් ද තමන් සෞඛ්‍ය ඇමති කමින් ඉල්ලා අස්වන්නට පවා විටෙක තීරණය කළ බව ප්‍රකාශ කළේ ය. පීටර් කැස්ටෙලෝ භාණ්ඩාගාරිකතුමා වියරු වැටුණු සිඟන්නෙකු සේ කීවේ මෙහෙම ගියොත් තව ටික කලකින් භාණ්ඩාගාරය හිස් වී සෞඛ්‍ය සුබ සාධනය කෙසේ වෙතත් කන්නවත් සල්ලි ඉතිරි නොවන බවයි.

හවඩ් අගමැතිවරයා බලයට පත් වූ දා සිටම උත්සාහ කළේ සැමට සුව සෙත (Univesal Medicare) ව්‍යාපෘතිය විනාශ කිරීමට ය. ඔහු උපායශීලී ලෙස ක්‍රම ක්‍රමයෙන් මෙම ව්‍යාපෘතිය විනාශ කරමින් සිටින බව මනසක් බුද්ධියක් ඇති ඕනෑම අයෙකුට වැටහිය යුතු ය. නමුත් පසුගිය ඡන්දයේ දී ඩොලර් මිලියන ගණන් විනාශ කරමින් අපව ගොනාට ඇන්දූ අයුරු නම් සිතා ගනීමට පවා අසීරු ය.

1996 ඡන්දයේදී හවඩ් මහතා එකල අගමැති වූ පෝල් කීටිං සමග සජීවී විවාදයකට එක්වුණේ ය.එහි දී මෙඩිකෙයා ගැන ඇසූ සෑම ප්‍රශ්ණයකටම කෙළින් පිළිතුරක් නොදීමට ඔහු වග බලා ගත්තේ ය. ඔහු කීවේ Univesal Medicare සමස්ථයක් ලෙසම ආරක්ෂා කරන බව ය. නමුත් 1977 දී ඔහු පුද්ගලික රක්ෂණ ආවරණයක් ලබා නොගන්නා ධනවතුන්ට බද්දක් පැවුයේ ය. එහිදී කැස්ටෙලෝ මහතා ප්‍රකාශ කළේ මෙය සාර්ථක වුවත් නැතත් තමන්ට වැඩක් නොවන බවත් අවශ්‍ය එකම දෙය නම් ඔවුනට රතු එළියක් පෙන්වා පුද්ගලික රක්ෂණ ක්‍රමයට යන ලෙසට බල කිරීම පමණක් බවත් ය. එය ද සාර්ථක නොවුණි.

පසුව 1998 දී පුද්ගලික රක්ෂණ සඳහා ගෙවන මුදලින් 30% ක් යළිත් ලබා ගත හැකි බව ප්‍රකාශ කරන ලදී. එය ද අසාර්ථක විය. සිදුවූ එකම දෙය නම් සැමදාම පුද්ගලික රක්ෂණ ආවරණ ලබාගන්නා ධනවතුන්ට මහජන සෞඛ්‍යය සඳහා වෙන් කරන ලද මුදලින් වාර්ෂිකව ඩොලර් මිලියන දෙකක මුදලක් පුද දීමයි.

නමුත් 2000 දී රජය ජීවිත කාලයටම ආරක්ෂාව යන තේමාව යටතේ අමතර බද්දක් පනවන ලදී. එහි තේමාව නම් පුද්ගලික රක්ෂණ ආවරණයක් ලබා නොගෙන සිටින අවුරුදු 30 ට වැඩි පුරවැසියන්ට ආදායම මත පනවන බද්දක් පැනවීම ය. මෙය නම් තාවකාලිකව සාර්ථකත්වයක් ලබා ගත් ව්‍යාපෘතියක් විය. අනතුරුව මෙයට තවත් ප්‍රචාරක ව්‍යාපාරයක් ද එක් වුණි. එහි තේමාව



නව සංශෝධන වලින් සිදුවූ එකම දෙය නම් සැමදාම පුද්ගලික රක්ෂණ ආවරණ ලබාගන්නා ධනවතුන්ට මහජන සෞඛ්‍යය සඳහා වෙන් කරන ලද මුදලින් වාර්ෂිකව ඩොලර් මිලියන දෙකක මුදලක් පුද දීමයි.

වූයේ විපතේ දී බේරීමට මඟක් යන්නයි. විශේෂඥ වෛද්‍යවරුන් මුණ ගැසීමේ දී හා ශල්‍යකර්ම සිදු කර ගැනීමේදී ඇතිවන දිගු පෝලිම මග හරවා ගැනීමේ මඟක් ලෙස පුද්ගලික රක්ෂණ ආවරණය හඳුන්වා දී තිබුණි. එහිදී රජයේ සෞඛ්‍ය සේවාව දෙවන පන්තියේ සේවාවක් ලෙස හඳුන්වා තබුණි.

තමා ඉපැදුණු තමා හැදුණු වැඩුණු පන්තිය අමතක කර දමා එම අයිතිවාසිකම් අනාගත පරපුරට උරුම කර නොදීමට ගන්නා මෙම අමානුෂික මෙහෙවර වෙනුවෙන් පල කරනු ලබන දැන්වීම් හා පාරිතෝෂික වෙනුවෙන් වෙන් කරන සියළුම මුදල් සමස්ථ මහජනතාවගේ හෙවත් අපේ මුදල් ය. මෙය ඌරාගේ මාළු ඌරා පිටම තබා කැපීමක් නොවන්නේ ද?

මේ අතරේ අවුරුදු හතරකට වරක් පැමිණෙන මහජනයා ගොනාට ඇන්දවීමේ මංගල්‍යය ට මුහුණ පෑමට මෙම හිත් පිත් නැති අකාරුණික පාලකයනට සිදුවිය. පුවත් පත් මගින් පවත්වන ලද ජනමත විචාරණ වලින් හෙළි වූයේ සෞඛ්‍ය සුබසාධනය මහජනයා ගේ පළමු තේරීම බව ය. පාලකයෝ වහ වහා වෘකයා හා සාන්තුවරයාගේ කතාව රඟ දැක්වීමට පටන් ගත්හ. වෘකයා බැටළු හමක් පොරවා ගෙන මරා දැමීමට නියමිතව ඇති මෙඩිකෙයා බේරා ගැනීමට ඉදිරිපත් විය. සාන්තුවරයකුගේ විලාසයෙන් ජනතාවට කීවේ දැඩි ආරක්ෂක දැලකින් මෙඩිකෙයාව බැඳ තබා තමා, මෙය පුද්ගලිකවම සුරකින බවයි. නමුත් ඔහු ඒ වෙනුවෙන් වන්දියක් ඉල්ලුවේ ය. ආදායමේ හැටියට ඩොලර් 250 සිට 1000 දක්වා මුදලක් තමාගේ අතින් දොස්තරවරුන්ට ගෙවීමයි. (පසුගිය දා මේ සීමාවන් තවත් වැඩි කරන ලදී) එහි දී දොස්තර බිල හා මෙඩිකෙයා විසින් ගෙවන ලද බිල අතර පරතරය ඉහත සීමා වලින් ඔබ්බට ගොස් ඇත්නම් එයින් 80% ක් ගෙවීමට තමා බැඳී සිටින බව බැටළු හම පොරවාගත් වෘක සාන්තුවරයා කළුළු පිරි මුහුණතින් යුතුව අපට කීවේ ය. අපි ඔහු විශ්වාස කර ඔහුව යළිත් රජ පුටුවේ තැබුවෙමු.

2004 වසරේ ජනවාරි මාසයේ දී සෙනෙට් මන්ඩලය විසින් මෙඩිකෙයා ආරක්ෂක දැල සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලදී. එහිදී අනාවරණය වූයේ ආරක්ෂක දැලෙන් දුප්පතුන්ට සෙතක් නොවන බව ය. මන්ද දැඩි රෝගාබාධ වලින් පෙළෙන දුප්පතුන්ට විශේෂඥ වෛද්‍යවරු මුණ ගැසීමේ දී ඩොලර් 150 සිට 250 අතර මුදලක් ගෙවීමට නොහැකි බැවින් ලැජ්ජා සහගත ලෙස ඔවුන් රජයේ රෝහල් වල බාහිර වෛද්‍ය සායන වෙත යොමු වන බවකි. ඉහත මුදලේ රජයේ සීමාවන් වන ඩොලර් 500 සිට 1000 ඉක්මවීමෙන් පසු ලබා ගත හැකි නමුත් එතරම් වත් මුදලක් ඔවුනට නොමැති බව අනාවරණය විය.

2004 ඔක්තෝබර් 9 වන දා ඡන්දයට ප්‍රථම ස්වාධීන තක්සේරුකරුවන් රජයට අවධාරණය කලේ Safety Net ඇස්තමේන්තු රජයේ ඇස්තමේන්තු ගත වටිනාකම මෙන් දෙගුණයක් වන බවත් මෙම හිඟය පියවා ගැනීමට මුදල් ප්‍රතිපාදන සකස් කර නොමැති බවත් ය. නමුත් රජය මෙම වාර්තා පදනම් විරහිත වාර්තා ලෙස ප්‍රතික්ෂේප කළ අතර ඒ ගැන වැඩිදුර කතිකාවක් විපක්ෂය පැත්තෙන් ද සිදු නොවුණි.

සෞඛ්‍ය ආර්ථික විශ්ලේෂකයකු වූ වාල්ස් ලින්ග්ස්ටන් ප්‍රකාශ කළේ Safety Net හි සමස්ථ වරප්‍රසාද භුක්ති විඳින්නේ පොහොසතුන් බව ය. මන්ද මූලික ගෙවීම් සඳහා අවශ්‍ය ඕනෑ තරම් මුදල් ඔවුන් සතු බැවිනි. ඔහුගේ සමීක්ෂණයේ පාදක තොරතුරු වලින් හෙළිවන්නේ සිඩ්නි නගර බද ධනවතුන් බහුල ප්‍රදේශයක් වන බ්‍රැඩ්ෆීල්ඩ් හී ඓහ හැව් භාවිතයේ අනුපාතය රජය වැය කරන සෑම ඩොලර් සියයකටම ඩොලර් 7.50 ක් වන විට මෙල්බන්හි වඩා පොහොසත් නැති ප්‍රදේශයක් වන ඩැන්ඩිනොන් ප්‍රදේශයේදී Safety Net භාවිතයේ අනුපාතය ඩොලර් 1.30 ක් වෙයි. Safety Net වැඩි ප්‍රතිලාභ කුමන පාර්ශවයකට ලැබෙන්නේද යන්න මේ දත්ත මනාව පැහැදිළි කරයි.

හවඩ් රජයේ සෞඛ්‍ය ප්‍රතිපාදන දුප්පතුන්ට දෙයාකාරයකින් හානි කරයි. එහි පළමුවැන්න විශේෂඥ වෛද්‍යවරුන්ට ඩොලර් 100 ත් 250 ත් අතර මුදලක් ගෙවීමට නොහැකි වීමයි. දෙවැන්න ඔවුන් රජයේ රෝහල් වල විශේෂඥ වෛද්‍ය සායන කරා යොමු වීමයි. එහි දී ද ඔවුනට දිගු පෝලිම් වල රැඳීමට සිදුවේ. මන්ද Safety Net මගින් රජයේ රෝහල් වලින් ප්‍රතිකාර ලබා දෙන විශෙෂඥ වෛද්‍යවරුන් සඳහා දිරි ගැන්වීමේ දීමනා වෙන් කර නොමැති බැවිනි.

ලාබයි ලාබයි.... සෞඛ්‍ය සේවයත් ගජරාමයට විකුණාගෙන කෑ හැකි සේවාවක් බවට පත් වී ඇත. ලිබරල් ප්‍රතිපත්තිය ප්‍රාග්ධන වෙළඳ පල න්‍යායට, මාර්කට් වෙළඳ පලට මිනිසුන්ගේ ඇට මස් ලේ පවා විකිණීමට අයිතියක් ඇත. දුප්පත් බවට මිනිස් කමට අනුකම්පාවක් ඇත්තේම නැත. ඇමෙරිකාවේ සහ කැනඩාවේ රෝගීන් මිලියන තුනකට මුදල් පොලියට දුන්න GE ෆිනෑන්ස් ඔස්ට්‍රේලියාවේ වෙළඳ පොළටද ඇතුළු වී ඇත.

10 වන පිටට